2016 - 07 - 08

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

**කතෝලික ධර්මය** **9 ශ්‍රේණිය**

| විභාග අංකය :........................................ | කාලය පැය 02 යි |
|---|---|

### I කොටස

★ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

★ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. "මා අනුව එන්න, මම ඔබ මිනිසුන් දිනන්නන් කරමි" යනුවෙන් ජේසුස් වහන්සේ පැවසුවේ,
(1) කානා නුවර දී ය. (2) ගලීල මුහුද අසල දී ය.
(3) සේනාකුළු ශාලාවේ දී ය. (4) දේව මාලිගාවේ දී ය.

02. 'මතෙටේස්' යන ග්‍රීක වචනයේ අර්ථය වන්නේ,
(1) පරිසිවරයා ය. (2) පූජකයා ය. (3) ශ්‍රාවකයා ය. (4) විනයධරයා ය.

03. ශු. සභාවේ උපන් දිනය ලෙස සලකනුයේ,
(1) මහ බ්‍රහස්පතින්දා දින. (2) මහ සිකුරාදා දින.
(2) පෙන්තකොස්ත දින. (4) ආලේලූයියා සෙනසුරාදා දින.

04. ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ නායකත්වය දැරුවේ,
(1) ජේදුරුතුමා. (2) පාවුළුතුමා.
(3) ජුවාම්තුමා. (4) ජාකොබ්තුමා.

05. සිරියානු ජාතික කුෂ්ට රෝගී නාමාන්ට සුවය ලබාදුන් දිවැසිවරයා වනුයේ,
(1) එලියා (2) එලීෂා (3) යෙසායා (4) ජෙරමියා

06. ප්‍රේම පාරමිතාව සඳහන් කර ඇති ග්‍රන්ථය,
(1) 1 කොරින්ති ලිපිය. (2) ගලාති ලිපිය.
(3) ක්‍රියා පොත. (4) 1 පේදුරු ලිපිය.

07. මෝසෙස්තුමාගේ සහයකයා වූයේ,
(1) ජෝශප් ය. (2) බෙන්ජමින් ය. (3) ආරොන් ය. (4) දාවිත් ය.

08. ශු. සභාවේ ලක්ෂණයක් නොවනුයේ,
(1) ඒකත්වය යි. (2) ශුද්ධත්වය යි. (3) සහෝදරත්වය යි. (4) අපෝස්තලිකත්වය යි.

09. ජේසුගේ කුඩා මල සාන්ත තෙරේසා මුනිවරියගේ මංගල්‍යය සමරනු ලබන්නේ,
(1) නොවැම්බර් 03 වැනිදා ය. (2) මැයි 06 වැනිදා ය.
(3) ජුනි 21 වැනිදා ය. (4) ඔක්තෝබර් 01 වැනිදා ය.

10. සාමුවෙල් දිවැසිවරයා කුඩා කල හැදී වැඩුනේ කිනම් පූජකයා යටතේ ද ?

(1) හන්නා (2) ඒලි (3) සෙකරියස් (4) මෙල්කිසදෙක්

11. ශුද්ධවූ සභාව පරම ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය ලෙස හැඳින්වූයේ,

(1) පේදුරුතුමාව ය. (2) පාවුළුතුමාව ය. (3) ජාකොබ්තුමාව ය. (4) ලූක්තුමාව ය.

12. ශු. බයිබලය ලේඛන ගත වූ කාලය,

(1) ක්‍රි. පූ. 950 - ක්‍රි. පූ. 100 වේ. (2) ක්‍රි. පූ. 450 - ක්‍රි. පූ. 100 වේ.

(3) ක්‍රි. පූ. 950 - ක්‍රි. ව. 100 වේ. (4) ක්‍රි. පූ. 850 - ක්‍රි. පූ. 100 වේ.

13. "මෙන්න මම මෙහි ය, මා යැව්ව මැනව" යි පවසමින් තම කැඳවීමට පිළිතුරු දුන්නේ,

(1) ඒලී ය. (2) යෙසායා ය. (3) මරියතුමිය ය. (4) සාමුවෙල් ය.

14. "මරණය තවත් නැත, වැලපීම ද හැඬීමද වේදනාවද තවත් නැත" මෙලෙස සඳහන් වන්නේ,

(1) එළිදරව්ව පොතේ ය. (2) උත්පත්ති පොතේ ය.

(3) නික්මයාම පොතේ ය. (4) එපීස ලිපියේ ය.

15. මාටින් ද පෝරස් මුනිතුමා හඳුන්වන ලද නාමයක් නොවනුයේ,

(1) දේව ධර්මයේ දූතයා. (2) සමාජ සාධාරණත්වයේ දූතයා.

(3) දයාවේ දූතයා. (4) සාමයේ දූතයා.

16. "දුව ඔබ රජ පවුලක යන්න අමතක කර දෙවියන් වහන්සේ ට බැහැපත්කමින් සේවය කරන්න." යන තම මවගේ අවවාදය පිළිගත්තේ,

(1) මරියතුමිය යි. (2) යුප්‍රේසියා මව්තුමිය යි.

(3) මරියා ගොරෙට්ටිතුමිය යි. (4) තෙරේසා මව්තුමිය යි.

17. බිඳ වැටෙන පවුල් සංස්ථාව ගොඩ නැඟීම වෙනුවෙන් කටයුතු කළේ,

(1) ගොඩ්වින් මෙන්ඩිස් මහතා යි. (2) තෝමස් මුවර්තුමා යි.

(3) මහත්මා ගාන්ධිතුමා යි. (4) ආචාර්ය මර්වින් ප්‍රනාන්දු පියතුමා යි.

18. පෙන්තකොස්ත දින ශුද්ධාත්ම දානය සඳහන් වනුයේ,

(1) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතේ ය. (2) ලූක් සුවිශේෂයේ ය.

(3) මාක් සුවිශේෂයේ ය. (4) පාවුළු ලිපි වලය.

19. ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කරන අවස්ථාවකි,

(1) නත්තල් දින ය. (2) ගොබ් ඉරුදින ය.

(3) මහ සිකුරාදා දින ය. (4) ආලේලූයියා සෙනසුරාදා ය.

20. සත්‍යවාදීව ජීවත් වන්නට අපට නියම වන දේව පණත,

(1) හත්වන පණත ය. (2) අටවන පණත ය.

(3) දහවන පණත ය. (4) පස්වන පණත ය.

(2 x 20 = 40)

REFERENCE ONLY

## II කොටස

★ තෝරාගත් ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

01. (1) ජේසුස් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකයන් තිදෙනෙකුගේ නම් ලියන්න.
(2) අපෝස්තුළුවරුන් ශු. සභාව තුළ ඉටුකළ මූලික කාර්යයන් 03ක් ලියන්න.
(3) ළමා ධර්ම දූතයෙකු ලෙස ක්‍රිස්තුන් වහන්සේට සේවය කිරීමේ දී පාවුළුතුමන්ගෙන් ගතහැකි ආදර්ශ 03 ක් ලියන්න.

(ලකුණු 3 + 3 + 6 = 12)

02. (1) ශු. සභාවේ ලක්ෂණ 03ක් ලියන්න.
(2) මුල් කිතුණු සභාවේ ලක්ෂණ 03ක් ලියන්න.
(3) මුල් කිතුණු සභාවේ ලක්ෂණ වර්තමාන සමාජය තුළ ක්‍රියාත්මක කිරීමට කළ හැකි දේවල් 6ක් ලියන්න.

(ලකුණු 3 + 3 + 6 = 12)

03. (1) 'අගපේ' යන ග්‍රීක් වචනයේ අර්ථය ලියන්න.
(2) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමේ දී බාහිර හා අභ්‍යන්තර සූදානම කෙටියෙන් පැහැදිලි කරන්න.
(3) අසීසියේ ප්‍රැන්සිස් මුනිඳුන්ගේ සාමයේ යැදුමේ අඩංගු කරුණු 06ක් ලියන්න.

(ලකුණු 3 + 3 + 6 = 12)

04. (1) ද්විතීය සම්මත ග්‍රන්ථ 03ක් නම් කරන්න.
(2) ශුද්ධවූ ලියවිල්ල තුළ දේවානුභාවයේ ත්‍රිවිධ ක්‍රියාකාරිත්වය නම් කරන්න.
(3) ඔබ ජීවත්වන පරිසරය තුළ දේව වචනය ප්‍රකාශ කිරීමට ඔබට කළ හැකි දේවල් 06ක් ලියන්න.

(ලකුණු 3 + 3 + 6 = 12)

05. (1) දේව කැඳවීමට අවනත වෙමින් මරිය තුමිය දුන් පිළිතුර කුමක් ද ?
(2) මරියතුමිය සම්බන්ධ මංගල්‍යයන් 03ක් ලියන්න.
(3) මරියතුමියගේ ගුණාංග 2ක් ශු. බයිබලය ඇසුරින් ඉදිරිපත් කරන්න.

(ලකුණු 3 + 3 + 6 = 12)

06. (1) ශුද්ධාත්මයාණන් හඳුන්වන වෙනත් නම් 03ක් ලියන්න.
(2) පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන් පැමිණි බවට සලකුණු 02ක් ලියන්න.
(3) සත්‍යයට සාක්ෂි දරීමේදී මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග 06ක් ලියන්න.

(ලකුණු 3 + 3 + 6 = 12)

07. පහත මාතෘකා 03ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(1) පුරාණ ගිවිසුමේ පාස්කු මංගල්‍යය.
(2) ශු. පාවුළුතුමාගේ සිත් හැරීම.
(4) ශා. ඇලෝසියස් ගොන්සාගා මුනිතුමා.
(5) අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණෝ.
(6) ප්‍රේම පාරමිතාව.

(ලකුණු 4 x 3 = 12)